{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පොස. සාමාන්‍ය පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026

11 - S බුද්ධ ධර්මය i - ii **කාලය පැ. 3 වී. 10**

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. අනේක ජාති සංසාරං..... යන පළමු උදාන වාක්‍යයට අනුව සසර නමැති ගෙය උපමා කොට ඇත්තේ,

   i. පංචස්කන්ධයට ය. ii. පාරමිතාවන්ට ය.

   iii. පන්සිල් වලට ය. iv. භෞතික සම්පත් වලට ය.

2. බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනු ලබන්නේ,

   i. බුද්ධ කෝලාහලය ලෙස ය. ii. පංච මහා විලෝකනය ලෙස ය.

   iii. ප්‍රථම උදාන වාක්‍යය ලෙස ය. iv. අභීත සිංහනාදය ලෙස ය.

3. බෝසත් උපත සිදු වී.....මහාමායා දේවිය කළුරිය කළ බව සඳහන්වේ.

Past Papers Wiki

i. දින දෙකකින් ii. දින හතරකින්.

iii. දින පහකින් iv. දින හතකින්

4. බුදු හිමි තුළ පැවති අසරණ සරණ ගුණයට නිදසුනක් ලෙස දැක්විය හැකි කතා පුවත කුමක්ද?

i. අංගුලිමාල කතා පුවත. ii. පූතිගත්ත තිස්ස පුවත.

iii. සෝණ දණ්ඩ පුවත. iv. ඡත්තමානවක පුවත.

5. **'දානං සීලංච නෙක්ඛම්මං...'**. මෙම ගාථාවෙන් ප්‍රකාශ වන්නේ,

i. දස කුසල් පිළිබඳව ය. ii. දස රාජධර්ම පිළිබඳව ය.

iii. දස පාරමිතා පිළිබඳව ය. iv. දස පුණ්‍යක්‍රියා පිළිබඳව ය.

6. තේජසින් සපිරි එහෙත් ශාන්ත වූ ප්‍රියංකර වූ බෝසතුන්ගේ අනූපමේය රූපශ්‍රීය දැක නිබ්බුත පද කී ශාක්‍ය වංශික කුමාරිකාව වන්නේ,

i. භද්දකච්චානා යි. ii. කිසාගෝතමිය යි.

iii. උප්පලවණ්ණා යි. iv. ජනපදකළ්‍යාණිය යි.

7. භික්ෂූන් වහන්සේ නමකගෙන් ඉටුවන සමාජ සේවයක් වන්නේ,

i. දානයට වැඩම කිරීම යි. ii. පිරිතට වැඩම කිරීම යි.

iii. වැව පිළිසකර කිරීම යි. iv. අවමගුලට වැඩම කිරීම යි.

8. අංගුලිමාල පිරිත දේශනා කරනු ලබන්නේ,

i. වැසි ඇතිවීමට ය. ii. තුන්බිය නැති කිරීමට ය.

iii. ගැබිනි මව්වරුන්ට ය. iv. විපත් ඇතිවන විට ය.

9. භාවනා වැඩීමෙන් ලැබිය හැකි ප්‍රතිඵල රාශියකි. සමථ භාවනා මගින් සාධනය **කරගත නොහැකි** ප්‍රතිඵලයක් වන්නේ,

i. සිත එක අරමුණක තබා ගැනීමට හැකිවීමයි.

ii. ගැටළු විසඳීමේ හැකියාව වර්ධනය වීමයි.

iii. ඉරිසියාව, ක්‍රෝධය වැනි දුර්ගුණයන්ට ගොදුරු වීම ඵල රහිත බව වැටහීමයි.

iv. ඉවසීමේ හැකියාව වර්ධනය වීමයි.

10. දෙලොව දියුණුව හා පිරිහීම පිළිබඳ විස්තර ඇතුළත් සූත්‍ර දේශනා දෙක ඇතුළත් වරණය තෝරන්න.

i. වසල සූත්‍රය හා පරාභව සූත්‍රය.

ii. වසල සූත්‍රය හා ව්‍යග්ඝපජ්ජ සූත්‍රය.

iii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය හා මංගල සූත්‍රය.

iv. මංගල සූත්‍රය සහ පරාභව සූත්‍රය.

11. පුද්ගලයාට අනර්ථය ගෙන දෙන අකුසල් මුල් තුනකි. ඒවා නම්,

i. රාග, ද්වේශ, මෝහ වේ.

ii. තණ්හා, දිට්ඨි, මාන වේ.

iii. ලෝභ, ද්වේශ, මෝහ වේ.

iv. ඊර්ෂ්‍යා, වෛර, ක්‍රෝධ වේ.

12. තමා විසින්ම පිළිපැද ඇස් පනාපිටම මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මරත්නය,

i. අකාලික නම් වේ.

ii. ඒහිපස්සික නම් වේ.

iii. ඕපනයික නම් වේ.

iv. සන්දිට්ඨික නම් වේ.

13. 'මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය' යනුවෙන් ප්‍රකාශ කළේ,

PAST PAPERS WIKI

i. අනගාරික ධර්මපාලතුමා ය. ii. දුටුගැමුණු රජතුමා ය.

iii. විජයබා ඔහු රජතුමා ය. iv. පරාක්‍රමබාහු රජතුමා ය.

14. තමාට හිත පිණිස නොවන අයහපත් දේ කිරීම ඉතා පහසුය. වැඩදායක වන යහපත් දේ කිරීම දුෂ්කරය. මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාව ආරම්භ වන්නේ,

i. අත්තනාව කතං පාපං...ලෙස ය. ii. සුකරානි අසාධුනි... ලෙස ය.

iii. තංච කම්මං කතං සාධූ ලෙසය. iv. නතං කම්මං කතං සාධු... ලෙසය.

15. ජීවිත හා දේපළ ආරක්ෂාව, පවුලේ සමගිය, මනා සිහි බුද්ධිය හා සෞඛ්‍ය ආරක්ෂිත බව යන කරුණු කෙරෙහි බෙහෙවින්ම බලපානු ලබන්නේ,

i. දස පිං කිරිය වත් ය. ii. පංචශීලය ය.

iii. ත්‍රිවිධ පුණ්‍යක්‍රියා ය. iv. සතර සංග්‍රහ වස්තු ය.

16. එළාර නම් ද්‍රවිඩ පාලකයාට පෙර මෙරට පාලනය කරන ලද්දේ,

i. පස්වන මිහිඳු රජු ය. ii. මානාභරණ රජු ය.

iii. සේන හා ගුත්තික දෙදෙනා ය. iv. බල්ලාට නාග රජු ය.

17. අප විසින් කළ යුතු දේ, නොකළ යුතු දේ බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. නොකළ යුතු දේ විරිත් ලෙස ද කළ යුතු දේ සිරිත් ලෙස ද හැඳින්වේ. මේ සඳහා ධර්මානුකූල විවරණය වන්නේ,

i. කරණීය හා අකරණීය යන්නයි. ii. කුසල හා අකුසල යන්නයි.

iii. පුණ්‍ය හා පාප යන්නයි. iv. විරමණය හා සමාදානය යන්නයි.

18. පුබ්බා චරිය, පුබ්බදේව, බ්‍රහ්ම යන විශේෂ නාමයන්ගෙන් හඳුන්වනු ලබන්නේ,

i. ගුරුවරුන් ය. ii. පැවිදි උතුමන් ය.

iii. ස්වාමි භාර්යාවන් ය. iv. දෙමාපියන් ය.

19. බුදු දහමේ මූලික ඉගැන්වීමක් ලෙස නොසැලකෙන්නේ,

i. හේතුඵල දහම යි. ii. චතුරාර්ය සත්‍යය යි.

iii. ත්‍රිලක්ෂණය යි. iv. පුනරුත්පත්තිය යි.

20. මෙලොව හිතසුව පිණිස හේතුවන උට්ඨාන, ආරක්ඛ, කල්‍යාණ මිත්‍ර, සමජීවිකතා යන චතුර්විධ සම්පත් ඇතුළත් සූත්‍ර දේශනාව හඳුන්වන්නේ,

i. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය නමිනි. ii. පත්තකම්ම සූත්‍රය නමිනි.

iii. සිගාල සූත්‍රය නමිනි. iv. පරාභව සූත්‍රය නමිනි.

21. කායික මානසික නිරෝගීතාවට බුදුදහමේ මූලිකත්වය හිමි වේ. ගේහසිත ශීලය නම් වූ පංච සීලයෙහි නිරෝගී බව සුරැකෙන ශික්ෂාපද දෙක කුමක්ද?

i. පළමු හා දෙවන ශික්ෂාපද ය. ii. පළමු හා සිව්වන ශික්ෂා පද ය.

iii. තෙවන හා සිව්වන ශිකෂාපද ය. iv. තෙවන හා පස්වන ශික්ෂාපදය.

22. තමන් ලබන ආදායමට සරිලන ලෙස වියදම් කිරීම හෙවත් මනා අයවැය පාලනය පිළිබඳ පැහැදිලි කරන්නේ,

i. උට්ඨාන සම්පදාව මගිනි. ii. ආරක්ඛ සම්පදාව මගිනි.

iii. කල්‍යාණ මිත්‍රතාව මගිනි. iv. සමජීවිකතාව මගිනි.

23. බුදුරජාණන් වහන්සේ කාලාම සූත්‍රය දේශනා කරනු ලැබුවේ,

i. කේසපුත්ත නියංගම් වැසියන්ටය. ii. කොසොල් ජනපද වැසියන්ට ය.

iii. වජ්ජි ජනපද වැසියන්ට ය. iv. නාලක බමුණු ගම් වැසියන්ට ය.

24. බුදුරදුන් බුද්ධත්වය සඳහා නේරංජනා නදී තීරය තෝරා ගත් බව සඳහන් වන්නේ,

Past Papers Wiki

i. අරියපර්යේෂණ සූත්‍රයේ ය. ii. වන රෝප සූත්‍රයේ ය.

iii. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. iv. දම්සක් පැවතුම් සූත්‍රයේ ය.

25. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යනු,

i. සතර සතිපට්ඨානය යි. ii. සිව් සඟරාවත යි.

iii. සතර ඍර්ධිපාද යි. iv. සිව් බඹ විහරණ යි.

26. විපාක දෙන කාලය අනුව කර්මය ප්‍රභේද හතරකි. ඊට අයත් නොවන්නේ,

i. ආචිණ්ණ කර්මය යි. ii. දිට්ඨධම්මවේදනීය කර්මය යි.

iii. උපපජ්ජ වේදනීය කර්මය යි. iv. අපරාපරියවේදනීය කර්මය යි.

27. ලංකා සමාජය තුළ සාමය හා සහජීවනය ආරක්ෂාවීමට අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් වන්නේ,

i. සර්ව ආගමික වතාවත්හි යෙදී කටයුතු කිරීම යි.

ii. තම ආගමට අයත් කටයුතුවල පමණක් නිරත වීම යි.

iii. අන්‍යාගමික අංග තමන්ගේ සේ සලකා කටයුතු කිරීම යි.

iv. තම ආගමික ප්‍රතිපදාවන් පුරන අතර අන්‍යාගමික පිළිවෙත් ඉවසීම යි.

28. බුදු දහමේ ඥාන රාශියක් පෙන්වා දෙන අතර චුතූපපාත ඤාණය යනු,

i. පෙර ආත්ම පිළිබඳ දන්නා නුවණයි.

ii. කෙලෙස් ප්‍රහීන කිරීම පිළිබඳ නුවණයි.

iii. අන් සතු සිත් පිළිබඳ දන්නා නුවණයි.

iv. මතු උපදින භවයන් පිළිබඳ දන්නා නුවණයි.

29. විවිධ ශාරීරික ආබාධයන්ට ලක්ව සිටි 'අසංක'නම් ශිෂ්‍යයා, හදිසි රිය අනතුරකට ලක්වීමෙන් එම ස්ථානයේදීම මිය ගියේය. ඔබ සිතන පරිදි ඔහුට බලපා ඇති පූර්ව අකුසලයන් මොනවාද?

i. සත්ව හිංසාව හා ප්‍රාණඝාතය.
ii. ද්වේශය හා සත්ව හිංසාව.
iii. ඊර්ෂ්‍යාව හා ප්‍රාණඝාතය.
iv. ප්‍රාණඝාතය හා සත්ව හිංසාව.

30. ඉපදීම, මහලු වීම, ලෙඩවීම, මරණය ආදී දුක් සහගත කරුණු අටක් බුදුදහම පෙන්වා දෙනු ලබයි. එහි පංචස්කන්ධය ලෙස දැක්වෙන්නේ,

i. ඇස, කන, නාසය, දිව, ශරීරය යි.
ii. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යි.
iii. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය යි.
iv. ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක යි.

31. **'හේතුං පටිච්ච සම්භූතං - හේතුභංගා නිරුජ්ඣති'** යන ධර්ම පාඨයෙන් අදහස් වන්නේ,

i. හේතුවක් ඇත්නම් ඵලයක් ඇති බවයි.
ii. හේතුවක් නිසා නිරෝධයක් ඇති නොවේ.
iii. මෙය ඇති කල්හි මෙය වෙයි.
iv. හේතු නැති වන විට හේතු නිසා හටගත් දෙයද නැතිව යයි.

32. ක්‍රිස්තු පූර්ව පළමු වන සියවසේදී මෙරටට නියඟයක් සහ බැමිණිතියා නම් සාගතයක් ඇතිවිය. මෙකල මෙරට සිටි රාජ්‍ය පාලකයා වූයේ,

i. වළගම්බා රජු ය.
ii. මහසෙන් රජු ය.
iii. දුටුගැමුණු රජු ය.
iv. කාවන්තිස්ස රජු ය.

33. බුදුරදුන් වැඩිම වස් කාලයක් ගත කළේ සැවැත්නුවර ය. එහිදී වසර දහනවයක් පුරාවටම උන්වහන්සේ වැඩ සිටි ආරාමය වූයේ,

i. වේළුවනාරාමය යි. ii. පූර්වාරාමය යි.

iii. ජේතවනාරාමය යි. iv. නිග්‍රෝධාරාමය යි.

34. සතර සතිපට්ඨානයට අයත් නොවන වරණය වන්නේ,

i. සීලානුපස්සනාව යි. ii. වේදනානුපස්සනාව යි.

iii. ධම්මානුපස්සනාව යි. iv. කායානුපස්සනාව යි.

35. ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්ථූප සයාකාර වේ. එහිදී ධාන්‍යාකාර හැඩයේ චේතියකට උදාහරණයක් වන්නේ,

i. රුවන්වැලි මහ සෑයයි. ii. කතරගම කිරි වෙහෙරයි.

iii. කැලණි දාගැබයි. iv. ථූපාරාම දාගැබයි.

36. ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රධාන කොටස් තුනකට බෙදේ. එය ත්‍රිශික්ෂාව නම් වේ. ත්‍රිශික්ෂාව ඇතුළත් වරණය වන්නේ,

i. දාන, ශීල, භාවනා ය. ii. අලෝභ, අදෝස, අමෝහ ය.

iii. සීල, සමාධි, පඤ්ඤා ය. iv. සිත, කය, වචනය ය.

37. ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය මගින් පැවැත් වූ සංගායනා අතර පළමුවැන්න රජගහ නුවරදී ද, දෙවැන්න විශාලා මහනුවරදී ද සිදුකරන ලදී. තෙවැන්න සිදුකරන ලද්දේ,

i. සැවැත්නුවරදී ය. ii. කොසඹෑ නුවරදී ය.

iii. මාතලේ අලු විහාරයේදී ය. iv. පැළලුප් නුවරදී ය.

38. චක්‍රවත්ති සීහනාද සූත්‍රාගත කරුණු අනුව නිවැරදි වරණය තෝරන්න.

i. වියළි ගොම, පරඬලා, දර ආදිය හේතු කරගෙන ගින්න හටගනියි.

ii. දිළින්දන්ට ධනය නූපදනා කල්හි දිළිඳුකම වැඩිවෙයි.

iii. වේදනාව නිසා තණ්හාව උපදියි.

iv. තෙල් හා පහන් සිලුව නිසා පහන දැල්වේ.

39. ඉඳි, හිටි, ඔත් හා චංකමන ලෙස ඉරියව් හතරකින් බුදුපිළිම නෙළීම දක්නට ලැබේ. චංකමන ඉරියව්ව සහිත පිළිමයකට නිදසුනක් වන්නේ,

i. හිඳගල විහාර පිළිමය යි.
ii. දිඹුලාගල විහාර පිළිමය යි.
iii. අවුකන ආබද්ධ පිළිමය යි.
iv. පොළොන්නරු තිවංක පිළිමය යි.

40. කැලණිය නව විහාරයේ සිතුවම් ඇඳි චිත්‍ර ශිල්පියා කවුරුන්ද?

i. ජෝර්ජ් කීට් මහතා ය.
ii. සෝලියස් මෙන්දිස් මහතා ය.
iii. සෝමබන්දු විද්‍යාපති මහතා ය.
iv. ඇල්බට් ධර්මසිරි මහතා ය.

ii පත්‍රය

1.

i. බුදුරජාණන් වහන්සේ තුළ පැවති තාදී ගුණය ප්‍රකට වන අවස්ථා දෙකකට නිදසුන් සපයන්න.

ii. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් අතර ගුරුවරයාට ශිෂ්‍යයකු විසින් ඉටුකළ යුතු යුතුකම් පහකි. ඉන් දෙකක් නම් කරන්න.

iii. සමානාත්මතාව යනු කුමක්දැයි සංක්ෂිප්තව දක්වන්න.

iv. බුදු දහමට අනුව බෞද්ධයකු විසින් නොකළ යුතු වෙළඳාම් අතරින් දෙකක් නම් කරන්න.

v. **දාන** හා **සීල** පාරමිතාවලට අදාළ වන ජාතක කතා දෙකක් නම් කරන්න.

vi. අටලෝ දහමේ දැක්වෙන අංග අට අතරින් යුගල දෙකක් ලියන්න.

vii. **''ඉමස්මිං අසති ඉදං න හෝති. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති''** යන්නෙහි අර්ථය දක්වන්න.

viii. පත්තකම්ම සූත්‍රයට අනුව බෞද්ධයකු විසින් ධන කළමනාකරණය කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

ix. දුක්ඛ සත්‍යය ප්‍රභේද තුනකින් යුක්තය. ඉන් දෙකක් නම් කරන්න.

x. 'පූජාවලිය' ග්‍රන්ථය රචනා කළ කතුවරයා හා එම කෘතියට පාදක කරගත් බුදුගුණය ලියා දක්වන්න.

2.

i. බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක කවරේද?.

ii. ඉහත (i) හි සඳහන් කළ එක් භාවනා ප්‍රභේදයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට භාවනාව උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

3.

i. **'සුකරානි අසාධුනි'** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ සරල අදහස ලියන්න.

iii. 'පුද්ගලයාගේ යහපත අයහපත පෙන්වා දෙන කෘතියකි, ධම්මපදය' විමසන්න.

4.

i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන ආකාරයට දකුණු හා නැගෙනහිර දිශාවන්ට උපමා කොට ඇත්තේ කවුරුන්ද?

ii. ඉන් එක් සමාජ කණ්ඩායමක් විසින් කළයුතු යුතුකම් ලියා දක්වන්න.

iii. ආපදාපන්න අවස්ථාවක දී යුතුකම් ඉටුකිරීම තුළින් සමාජ සහජීවනය ගොඩනැගෙන ආකාරය විස්තර කරන්න.

5.

i. පරිසරයට අදාළ ප්‍රධාන ප්‍රභේද දෙක ලියා දක්වන්න.

ii. බුදුරදුන් වස් විසූ ස්ථාන තුනක් නම් කරන්න.

iii. බුදුරදුන් පරිසරයේ සුන්දරත්වය ඇගැයීමට ලක් කළ අවස්ථා මොනවාදැයි පෙන්වා දෙන්න.

6.

i. තෙවන ධර්ම සංගායනාව පැවැති ස්ථානය හා සහභාගි වූ භික්ෂූන් සංඛ්‍යාව ලියා දක්වන්න.

Past Papers Wiki

ii. එම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ශාසන චිරස්ථිතිය සඳහා තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල හේතු වූ ආකාරය විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

i. බුද්ධ ප්‍රතිමා

ii. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

iii. දසරාජ ධර්මය

iv. වාහල්කඩ

PAST PAPERS WIKI

අ.පොෂ සාමාන්‍ය පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය 1 සඳහා පිළිතුරු පත්‍රය - 2026

11 - S බුද්ධ ධර්මය 1- 11

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	1	11	3	21	4	31	4
02	2	12	4	22	4	32	1
03	4	13	2	23	1	33	3
04	4	14	2	24	1	34	1
05	3	15	2	25	2	35	3
06	2	16	3	26	1	36	3
07	3	17	4	27	4	37	4
08	3	18	4	28	8	38	2
09	3	19	4	29	1	39	4
10	4	20	1	30	2	40	2

I. කොසොල් මහ රජතුමා,අනේපිඬු සිටුතුමා,විශාඛා වැනි ප්‍රභූවරුන්ගේ ලාභ හමුවේ උද්දාමයට පත් නොවීම.

දොළොස්වන වස් කාලය වේරංජා නුවර ගත කරමින් තුන් මස පුරාවටම අශ්වයින්ට ලබා දෙන යව නමැති කටුක ආහාරයෙන් ගත කිරීමට සිදු වීම. එය අලාභයක්, දුකක් ලෙස නොසිතීම.

සුප්පිය නම් පරිබ්‍රාජකයා දොස් නැගූ අවස්ථාවේ ද බ්‍රහ්මදත්ත නම් ඔහුගේ අන්තේවාසිකයෙකු ප්‍රශංසා කරමින් ගුණ ගැයූ අවස්ථාවේ දීත් උද්දාමයට පත් නොවීම.

බුදු රජාණන් වහන්සේට අපහාස කළ සුන්දරී පරිබ්‍රාජිකාව හමුවේදීත් මාගන්දියා හා චිංචාමානවිකාව වැන්නවුන්ගේ නින්දා හමුවේත් අක්කෝසභාරද්වාජ, කසීභාරද්වාජ වැනි බ්‍රාහ්මණයන්ගේ අපවාද හමුවේත් සම මෙතින් හා සම සිතින් මුහුණ දීම.

ආගමික නායකයන් වූ සෝණදණ්ඩ,චංකී,පොට්ඨපාද වැනි බ්‍රාහ්මණයින් හා පිරිවැජියන් කළ ප්‍රකාශවලින් සතුටට පත් නොවීම.

II. 1.දුටු විට හුනස්නෙන් නැගිටීම.
2.අවශ්‍ය උපස්ථාන කිරීම.
3.අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම.
4.අවශ්‍ය කටයුතු ඉටුකර දීම.
5.මැනවින් ඉගෙන ගැනීම.

III. රටක ජනතාව විවිධ කුල,ජාති,ආගම්,භාෂා අනුව වර්ග වී සිටිය ද ඒ සියලු දෙනා කෙරෙහි සම සිතින් කටයුතු කිරීම සමානාත්මතාවය යි.

IV. 1. අවි ආයුධ වෙළෙඳාම
2. සත්ත්ව වෙළෙඳාම
3. මස් වෙළෙඳාම
4. වස විස වෙළෙඳාම
5. මත් ද්‍රව්‍ය වෙළෙඳාම

V. දාන පාරමිතාව - වෙස්සන්තර ජාතකය,සිවි ජාතකය,සස ජාතකය
සීල පාරමිතාව - සීල විමංස ජාතකය

VI. ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රසංසා, සැප-දුක

VII. මෙය නැති කල්හි මෙය ඇති නොවේ - මෙය නැති වීමෙන් මෙය නැති වේ.

VIII. තම උත්සාහයෙන්, දැතේ ශක්තියෙන්, දහඩිය වගුරුවා දැහැමින් උපයා ගන්නා ධනය සතරාකාරයකින් පරිභෝග කළ යුතු බව.

IX. 1. දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක්)
2. විපරිනාම දුක්ඛතා (වෙනස් වීමේ දුක)
3. සංඛාර දුක්ඛතා (ඇතිවීම නැතිවීම හේතුවෙන් හටගන්නා දුක)

X. කතුවරයා - මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමිපාණන්
පාදක කරගත් බුදු ගුණය - අරහං බුදු ගුණය

ආදර්ශ ප්‍රශ්න පත්‍රය 1

බුද්ධ ධර්මය ii කොටස පිළිතුරු පත්‍රය (2 - 7)

2. i.

- සමථ භාවනාව
- විපස්සනා භාවනාව

2. ii

✓ **සමථ භාවනාව**

- සිතේ පවතින රාග, ද්වේෂ, මෝහ ආදී ක්ලේශයන් යටපත් කර සිතේ එකඟතාව හෙවත් චිත්ත ඒකග්ගතාව වර්ධනය කරගැනීම මෙයින් සිදුවේ.
- ආනාපානසති භාවනාව, මෙත්තා භාවනාව, අසුභ භාවනාව, බුද්ධානුස්සති භාවනාව ආදී කර්මස්ථාන 40ක් මේ සඳහා යොදා ගැනේ.
- පංච නීවරණ (කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා) තාවකාලිකව යටපත් වේ.
- පඤ්ච අභිඤ්ඤා හා අෂ්ට සමාපත්ති යන ධ්‍යාන මට්ටම් කරා ළඟා වීමට හැකිවීම ප්‍රතිඵල අතර වේ.
- භාවනාව මගින් මතක ශක්තිය දියුණු වීම, ඉවසීම වැඩීම, ගැටලු විසඳීමේ ශක්තිය ලැබීම වැනි ලෞකික ප්‍රයෝජන හිමිවේ.
- ක්ෂණිකව සිත සමාධිගත වේ.

✓ **විපස්සනා භාවනාව**

- සංසාරික දුක නමැති ''අවුල'' නිරවුල් කරගැනීමට නම් ශීලයේ පිහිටා, සමාධිය සහ ප්‍රඥාව වැඩිය යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.
- විදර්ශනාව යනු ලෝකයේ සහ ජීවිතයේ ''ඇති තතු ඇති සැටියෙන්'' දැකීමයි. සමථ භාවනාවෙන් කෙලෙස් යටපත් කරන අතර, විදර්ශනා භාවනාවෙන් කෙලෙස් මුලින්ම උදුරා දමනු ලබයි.
- ලෝකයේ සාමාන්‍ය ව්‍යවහාරය (උදා: රථය, සත්වයා, පුද්ගලයා) සම්මුති සත්‍යය වන අතර, ඒවායේ සැබෑ ස්වභාවය විමසා බැලීමේදී හමුවන පංචස්කන්ධය වැනි ධර්මතා පරමත්ථ සත්‍යය වේ.
- සත්වයා හෝ ලෝකය යනු රූප, වේදනා, සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාණ යන ස්කන්ධ පහේ එකතුවකි.
- විදර්ශනා වඩා පංචස්කන්ධයේ සැබෑ ස්වභාවය අවබෝධ කරගැනීම යනු ත්‍රිලක්ෂණය අවබෝධ කරගැනීමයි.
- 1. අනිත්‍ය:- සියලු සංස්කාර ධර්මයන් මොහොතින් මොහොත වෙනස් වන සුළුය.
- 2. දුක්ඛ:- වෙනස් වන ස්වභාවය නිසාම ඒවා තෘප්තිමත් නොවන, පීඩාකාරී දේ වේ.
- 3. අනාත්ම:- ස්කන්ධයන් කෙරෙහි "මම", "මගේ" හෝ "මගේ ආත්මය" කියා ගත හැකි ස්ථිර සාරයක් නොමැත.
- ත්‍රිලක්ෂණය අවබෝධ කරගන්නා තැනැත්තා කෙලෙස්වලින් මිදී නිවන් සුවය ලබන අතර, මෙලොව ජීවිතයේදී අටලෝ දහමින් කම්පා නොවන සන්සුන් පුද්ගලයෙකු බවට පත් වේ.

2. iii

- සිතේ එකඟතාව (කෙලෙස් යටපත් වීම) නිසා ඉගෙන ගන්නා කරුණු හොඳින් ධාරණය කරගැනීමටත්, විභාගවලදී නිවැරදිව මතකයට ගැනීමටත් උපකාරී වේ.
- විභාග සහ අධ්‍යාපනික කටයුතු නිසා ඇතිවන බිය, චිත්තවේග සහ මානසික ආතතිය අවම කරගැනීමට භාවනාවෙන් මනස ශාන්ත වේ.
- පන්ති කාමරයේදී හෝ නිවසේදී පාඩම් වැඩවල යෙදෙන විට වෙනත් බාහිර අරමුණුවලට සිත යොමු නොවී එකඟතාවයෙන් කටයුතු කිරීමට හැකි වේ.
- භාවනාව තුළින් ලැබෙන මානසික සංවරය නිසා දෛනික වැඩකටයුතු සැලසුම් සහගතව හා හික්මීමෙන් කිරීමට පෙළඹේ.
- ආනාපානසති වැඩීමෙන් සිත සන්සුන් වන අතර කායික නිරෝගීබව ද වැඩේ.
- මෙත්තා (මෛත්‍රී) භාවනාව වැනි ක්‍රම මගින් අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටත්, කෝපය පාලනය කරගනිමින් යහපත් ශිෂ්‍යයෙකු ලෙස ජීවත් වීමටත් මගපෑදේ

3. i

සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච

යං වේ හිතං ච සාධුං ච - තං වේ පරමදුක්කරං

3. ii

තමාට අහිත පිණිස පවතින, නරක (අකුසල) කර්ම කිරීමට ඉතා පහසුය. නමුත් තමාට හිත පිණිස පවතින, යහපත් (කුසල) කර්ම කිරීම ඉතාමත් දුෂ්කරය.

3. iii

- තමාට කළ අකටයුතුකම් ගැන නැවත නැවත සිතමින් ක්‍රෝධ කරන්නන්ගේ වෛරය නොසන්සිඳෙන බවත්, එසේ නොසිතන්නන්ගේ වෛරය සංසිඳෙන බවත් ධම්මපදයේ ඉගැන්වේ. (නහී වේරේන වේරානි...)
- යම් ක්‍රියාවක් කිරීමෙන් පසු පසුතැවීමට සිදු වේ නම් එය අයහපත් ක්‍රියාවකි. (නතං කම්මං කතං සාධු..)
- යම් ක්‍රියාවක් කිරීමෙන් පසු සතුටක් ඇති වේ නම් එය යහපත් ක්‍රියාවකි. (තංච කම්මං කතං සාධු..)
- පිරිසිදුකම හෝ අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම පමණක් වන අතර, එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය. (අත්තනාව කතං පාපං..)
- තමාට අහිතකර අයහපත් දේ කිරීම පහසු වුවද, තමාට වැඩදායක යහපත් දේ කිරීම ඉතා අපහසු කාර්යයකි. (සුකරානී අසාධූනී..)
- තරුණ වියේදී ධනය උපයා නොගන්නා සහ උසස් පිළිවෙත්වල නොහැසිරෙන අය, මහලු වියේදී මසුන් නැති විලක සිටින කොස්වා ලිහිණියන් මෙන් පසුතැවෙති. (අචරිත්වා බ්‍රහ්මචරියං..)
- උත්සාහය, නිවැරදි සිහිය, විමසා බැලීම (යෝනිසෝ මනසිකාරය), සංවරය, දැහැමි දිවි පෙවත සහ අප්‍රමාදී බව පුද්ගලයෙකුගේ දියුණුවට හා කීර්තියට හේතු වේ. (උට්ඨානවතෝ සතිමතෝ...)

4. i

- නැගෙනහිර දිසාව -දෙමාපියන්
- දකුණු දිසාව - ගුරුවරුන්

4. ii **දෙමාපියන් විසින් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්**

1. පවින් වැළැක්වීම.
2. යහපතෙහි/කුසලයෙහි පිහිටුවීම.
3. ශිල්ප ශාස්ත්‍ර ලබා දීම.
4. සුදුසු වයසෙහිදී ආවාහ විවාහ කර දීම.
5. සුදුසු කාලයේදී දායාද පවරා දීම.

ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට ඉටුකළ යුතු යුතුකම්

1. සිසුන් යහපත් මඟෙහි හික්මවීම.
2. සිසුන්ට ශිල්ප ශාස්ත්‍ර මැනවින් උගන්වා දීම.
3. සියලු ශිල්ප නොඅඩුව උගන්වා දීම.
4. මිතුරන් අතර ආරක්ෂාව සැලසීම (ගෞරවය රැක දීම).
5. හැම තැනදීම රැකවරණය සැලසීම.

PAST PAPERS WIKI

4. iii

- ආපදාපන්න අවස්ථාවකදී එකිනෙකා කෙරෙහි යුතුකම් ඉටු කිරීමෙන් සමාජ සහජීවනය ගොඩනැගේ.
- කරදරයකට පත්ව සිටින අයෙකුට පිහිට වීම තුළින් සමාජය තුළ ආත්මාර්ථකාමීත්වය නැති වී, අන් අයගේ දුක හඳුනන මානුෂීය ගුණධර්ම වර්ධනය වේ.

- ඕනෑම ආපදා අවස්ථාවකදී තමන් තනි වී නැති බවත්, සමාජයේ අන් අයගේ සහයෝගය ලැබෙන බවත් හැඟී යාමෙන් එකිනෙකා කෙරෙහි ඇති විශ්වාසය හා සුරක්ෂිතභාවය වැඩි දියුණු වේ.
- මුදල්, කුලය, ආගම හෝ ජාතිය වැනි වෙනස්කම් අමතක කර සියලු දෙනා එකමුතුව කටයුතු කිරීමට ආපදා අවස්ථාවන්හිදී ඉටු කරන යුතුකම් මග පාදයි.
- සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි 'අනාථයන්ට හා ආපදාවට පත්වූවන්ට පිහිට වීම' තුළින් පුද්ගලයන් අතර පරස්පර ගෞරවය, ආදරය සහ සුහදතාව ගොඩනැගේ.
- ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු නොවන ආපදා අවස්ථාවලදී ඇතිවිය හැකි නොසන්සුන්තා, ගැටුම් සහ අපරාධ, සමාජීය යුතුකම් ඉටු කිරීම තුළින් වළක්වා ගත හැකිය.

5. i

- භෞතික පරිසරය (අජීවී පරිසරය)
- ජෛවීය පරිසරය (සජීවී පරිසරය)

5. ii

- රජගහනුවර වේළුවනාරාමය
- ශ්‍රාවස්තී නුවර ජේතවනාරාමය
- විශාලා මහනුවර කූටාගාරශාලාව
- පූර්වාරාමය
- සෝෂිතාරාමය
- මකුල පබ්බතය

5. iii

- බුද්ධත්වයට පෙර අනුපිය අඹවනෙන් නික්ම උරුවෙල් දනව්වට වැඩි බෝධිසත්ත්වයන් වහන්සේ, එහි වූ සිත්කළු භූමි භාගය, පසන් වන ලැහැබ, ගලාබසිනා පිරිසිදු නදිය සහ අසල වූ ගෝචර ගම දැක ''බවුන් වඩන කුලපුත්‍රයකුට මෙය සැබවින්ම සුදුසු ස්ථානයකි" යනුවෙන් උරුවෙල් දනව්වේ ස්වාභාවික සෞන්දර්ය අගය කරමින් පරිසරයේ රමණීයත්වය ඇගයීමට ලක් කිරීම.
- මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව, පිරිනිවන් පෑමට ආසන්න සමයේ ආනන්ද හිමියන්ට ආනන්ද චේතිය, උදේන චේතිය, ගෝතමක චේතිය, සත්තම්බ චේතිය, බහුපුත්ත චේතිය සහ පාවාල චේතිය ආදී ස්ථාන පෙන්වා "ආනන්දය, විශාලා මහනුවර රමණීයයි, උදේන චේතිය රමණීයයි..." ආදී වශයෙන් එම ස්ථානවල රමණීයත්වය සිහිපත් කිරීම.
- රජගහනුවර පිහිටි ගිජ්ඣකූට පර්වතය, ගෝතමක නිග්‍රෝධය, චෝරපපාතය, සත්තපණ්ණි ගුහාව, ඉසිගිලි පර්වත පාර්ශවයේ වූ කාලසිලාව සහ වේභාර පර්වත පාර්ශවයේ වූ සත්තපණ්ණි ගුහාව ආදී ස්ථානවල ස්වාභාවික අලංකාරය හා ශාන්ත බව අගය කිරීම.
- ලෞකික ජනයා නොඇලෙන, විවේකී, නිශ්ශබ්ද වන අරණෙහි ඇති ශාන්ත භාවය කෙලෙස් තැවූ වීතරාගී උතුමන්ගේ මනසට ගෙනෙන සැනසිල්ල අගය කිරීම.

6. i

ස්ථානය - පාටලිපුත්‍ර නුවර අශෝකාරාමය

සහභාගි වූ භික්ෂූන් ගණන - මොග්ගලීපුත්ත තිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දහස් නමක්

6. ii

- ධර්මාශෝක රජතුමාගේ බෞද්ධ ප්‍රතිපත්තිය නිසා ශාසනයට ලැබුණු අතිමහත් ලාභ සක්කාර දැක, ජීවත් වීම සඳහා අන්‍ය තීර්ථකයන් තම මත අතනොහැර සිවුරු දරා භික්ෂූන් ලෙස පෙනී සිටීම.
- මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ අසංවර හා අධර්මවාදී හැසිරීම් නිසා සංඝයා වහන්සේලා එකමුතුව පොහොය කර්ම කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් වසර හතක් පුරා අශෝකාරාමයේ පොහොය කර්මය නතර වී තිබීම.
- ධර්මාශෝක රජතුමාගේ සහාය ඇතිව අධර්මවාදීන් සිවුරු හරවා යවා, ශාසනයේ අනාගත සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අවශ්‍යතාව මතු වීම.

Past Papers Wiki

6. iii

- සිවුරු දරාගෙන සිටි 60 000ක් පමණ වූ අන්‍ය තීර්ථකයන් පරීක්ෂා කර ශාසනයෙන් පිටුවහල් කොට සංඝ ශාසනය පවිත්‍ර කිරීම.
- මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ විසින් අන්‍ය තීර්ථකයන්ගේ මිථ්‍යා මත ඛණ්ඩනය කරමින් 'කථාවත්ථු පකරණය'නම් අභිධර්ම ග්‍රන්ථය සංග්‍රහ කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම.
- සංගායනාවෙන් පසු රටවල් නවයකට ධර්මදූත පිරිස් පිටත් කර යැවීම.
- බුද්ධ භාෂිතය එලෙසින්ම ආරක්ෂා කරගනිමින් ත්‍රිපිටක ධර්මය නැවත වර්ගීකරණය කර පාරිශුද්ධියට පත් කිරීම.

7. කෙටි සටහන්

1. බුද්ධ ප්‍රතිමා

- භාරතයේ කණිෂ්ක රජ සමයේ ගන්ධාර සහ මථුරා කලා ශෛලීන් ඔස්සේ පළමු බුද්ධ ප්‍රතිමා නිර්මාණය විය.
- මුල් යුගයේ බුදුරජාණන් වහන්සේ සංකේතවත් කිරීමට සිරිපතුල, ධර්මචක්‍රය, බෝධිය, චේතිය වැනි සංකේත භාවිත කළ අතර, පසුව බුද්ධ ප්‍රතිමා නිර්මාණය ආරම්භ විය.
- හිඳි පිළිම - සමාධි මුද්‍රාව, වීරාසනය හෝ පද්මාසනය (උදා:- අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව, තොලුවිල පිළිමය).
- හිටි පිළිම - අභය, වරද හෝ විතර්ක මුද්‍රා (උදා:- අවුකන බුද්ධ ප්‍රතිමාව, මාලිගාවිල පිළිමය).
- සැතපෙන පිළිම - පරිනිබ්බාන හෝ සීහසෙය්‍යාව (උදා:- ගල්විහාරයේ සැතපෙන පිළිමය, තන්තිරිමලේ පිළිමය).
- බුදුරජාණන් වහන්සේගේ මහා පුරිස් ලක්ෂණ, ශාන්ත බව සහ වීතරාගී බව නිරූපණය කිරීමට ශිල්පීන් උත්සාහ කර ඇත.

2. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

- බුදුරජාණන් වහන්සේගේ පූර්ව ජන්ම චරිත ඇතුළත් ජාතක කතා, කුරුණෑගල යුගයේදී iv පරාක්‍රමබාහු රජ සමයේදී පාලි ජාතකට්ඨකතාවෙන් සිංහලයට පරිවර්තනය කරන ලදී.
- ජාතක කතා 547ක් ඇතුළත් වන අතර බෝධිසත්ත්වයන් වහන්සේ පාරමිතා පූරණය කළ ආකාරය විස්තර කෙරේ.
- ගායනා කළ හැකි ශෛලියේ සිංහල ගද්‍ය කෘතියකි..
- එකල සමාජ සංස්කෘතික තොරතුරු රැසක් අඩංගු වේ.
- පුද්ගල චරිත සංවර්ධනය, සමාජීය අගයන්, සදාචාරාත්මක උපදෙස් සහ ප්‍රායෝගික ජීවිතයට අවශ්‍ය බුද්ධිමත් බව වර්ධනය කිරීමට උපකාරී වේ.

3. දසරාජ ධර්මය

- රටක් පාලනය කරන පාලකයෙකු තුළ පැවතිය යුතු ගුණධර්ම 10කි.
- **දානං සීලං පරිච්චාගං -අජ්ජවං මද්දවං තපං**
  අක්කෝධෝ අවිහිංසා ච - ඛන්තී ච අවිරෝධතා
- ප්‍රජාවගේ යහපත උදෙසා පරිත්‍යාග කිරීම දානයයි.
- පංචශීලය සුරකිමින් යහපත් චරිතයකින් යුක්ත වීම සීලයයි.
- මහජන අභිවෘද්ධිය උදෙසා තමාගේ සැප සම්පත් හා කාලය කැප කිරීම පරිත්‍යාගයයි.
- ඍජු බව සහ වංචාවෙන් තොර අවංකභාවය.
- මෘදු මොළොක් බව සහ නම්‍යශීලී පැවැත්ම.
- අටලෝ දහමින් කම්පා නොවී දැඩි ව්‍රත සමාදානයෙන් හා කැපවීමෙන් කටයුතු කිරීම.
- ක්‍රෝධ නොකිරීම සහ කෝපය පාලනය කරගැනීම.
- කිසිදු සත්ත්වයෙකුට හෝ ජනතාවට හිංසා පීඩා නොකිරීම.
- ඉවසීම සහ සහනශීලී බව.
- නීතියට, ජනතාවගේ කැමැත්තට සහ සාධාරණත්වයට එරෙහිව කටයුතු නොකිරීම.

4. වාහල්කඩ

- ශ්‍රී ලාංකේය ස්තූප වාස්තු විද්‍යාවේ දක්නට ලැබෙන, ස්තූපයේ සතර දිශාවෙන් ඉදිකරනු ලබන විශේෂ අංගයකි.
- ස්තූපයේ ගෘහ නිර්මාණ ශිල්පීය අලංකාරය වැඩි දියුණු කිරීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ගලින් නිර්මාණය කර ඇති අතර, එහි කැටයම් ලෙස ගජලක්ෂ්මී රූප, මකර තොරණ, සත්ව රූප (ඇතා, ගොනා, සිංහයා, අශ්වයා), මල් ලතා සහ නාගරාජ රූප ඇතුළත් වේ.
- මිහින්තලේ කණ්ඨක චේතිය, අනුරාධපුර රුවන්වැලිසෑය, ජේතවනාරාමය සහ අභයගිරිය යන ස්තූපවල පැරණි වාහල්කඩ අලංකාරය හා කලාත්මක අගය විදහාපායි.

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library